මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் அமைச்சு
MINISTRY OF FINANCE AND PLANNING

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01 Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: 2484500, 2484600, 2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11 - 2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No.: BD/GPS/130/9/2
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2010.12.07

අයවැය චක්‍රලේඛ අංක :150

අමාත්‍යාංශ ලේකම්වරු/පළාත් සභා ප්‍රධාන ලේකම්වරු/දෙපාර්තමේන්තු ප්‍රධානීන්/
දිස්ත්‍රික් ලේකම්වරු/ව්‍යවස්ථාපිත මණ්ඩල සභාපතිවරු

**රාජ්‍ය ආයතන සඳහා මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ වාහන මිල දී ගැනීම පිළිබඳ උපදෙස්**

රාජ්‍ය ආයතන සඳහා මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ වාහන මිලදී ගැනීම පිළිබඳ ඉදිරිපත් කරන ලද අංක 10/2238/404/122 හා 2010.08.30 දින දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සඳහා 2010.09.29 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. ඒ අනුව, මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ වාහන සැපයීම සඳහා මෙම උපදෙස් මාලාව නිකුත් කරනු ලැබේ.

1. **හිමිකම් ලබන්නන්**

අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා සහ ඒකාබද්ධ අරමුදලින් වාහන මිල දී ගැනීම සඳහා වියදම් දැරීමට සිදුවන රාජ්‍ය ආයතන මේ යටතේ වාහන ලබාගැනීම සඳහා හිමිකම ලබයි. මෙම ක්‍රමය යටතේ වාහන සැපයීමේ දී අවුරුදු 10 කට වඩා පැරණි සහ ආර්ථික වශයෙන් ඵලදායි නොවන වාහන අපහරණය කිරීමට සහ කුලී වාහන ඉවත් කිරීම සඳහා ප්‍රමුඛතාවය ලැබෙනු ඇත.

2. **කල්බදු (Leasing) සමාගම් තෝරාගැනීම**

ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් වාහන මිල දී ගැනීමට අදාල ගිවිසුම්වල නියමයන් හා කොන්දේසි පිළිබඳව මහජන බැංකුවට අනුබද්ධිත පීපල්ස් ලීසිං සමාගම සහ ලංකා බැංකුව සමග සාකච්ඡා කර 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 3.3 විධිවිධාන අනුගමනය කරමින්, රජයට වඩාත් වාසිදායක මිල ගණන් සහ කොන්දේසි ඉදිරිපත් කරන කල්බදු සමාගම, එම කල්බදු සමාගම් අතරින් තෝරාගනු ඇත. එලෙස, තෝරාගත් කල්බදු සමාගම සමග වසරක කාලයක් සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුව, මහ භාණ්ඩාගාරය වෙනුවෙන් වාහන මිලදී ගැනීම පිළිබඳ ගිවිසුමකට අත්සන් තබනු ඇත.

3. වාහන ඉල්ලුම් කිරීමේ පරිපාටිය

ඉහත අංක 01 වගන්තිය යටතේ සුදුසුකම් ලබන රාජ්‍ය ආයතනවල ආයතන ප්‍රධානින් තම රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශ සහිතව තම ඉල්ලුම් පත් මෙම චක්‍රලේඛයේ ඇමුණුම අංක 01 හි සඳහන් තොරතුරු ද සමඟ ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුයි.

4. අනුමත කිරීමේ පරිපාටිය

ජාතික අයවැය දෙපාර්තමේන්තුව, වාහන ඉල්ලුම් පත්‍ර අධ්‍යයනය කර ප්‍රමුඛතාගත කරන ලදුව වාහන ලබාදිය යුතු ආයතන සඳහා ඉහත අංක 02 වගන්තිය යටතේ තෝරාගත් කල්බදු සමාගම වෙතින් වාහන මිල දී ගැනීම සඳහා අනුමැතිය ලබාදෙනු ඇත. ඒ අනුව, එම රාජ්‍ය ආයතනය, ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාදුන් කල්බදු සමාගම වෙතින් අදාල වාහනය මිල දී ගත යුතු ය.

5. වාහන වර්ග

මෙම මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ අයවැය දෙපාර්තමේන්තුවේ අනුමැතියට යටත්ව පහත දැක්වෙන නව වාහන (Brand New) මිල දී ගත හැක.

- මෝටර් කාර් රථ
- වෑන්/මිනි බස් (ආසන 29 නොඉක්මවන)
- කැබ් රථ
- උපයෝගිතා වාහන

6. වාහන සඳහා උපරිම මිල මට්ටම් සීමාව

මෙම මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ නිල වාහන හිමිකම් ඇති එක් එක් කාණ්ඩයේ නිලධාරීන් සඳහා මිල දී ගතහැකි වාහන වල නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බදු සහ රේගු බදු කපා හැරෙන බැවින් ඒවායේ උපරිම මිල සීමාව පහත දැක්වේ. මෙම ක්‍රමය යටතේ නිල වාහන හිමිකම ඇති නිලධාරීන් සඳහා ලබාගත හැක්කේ පෙට්‍රල් කාර් රථ පමණි. කැබ් රථ සහ වෑන් රථ ලබාදෙනුයේ ක්ෂේත්‍ර කටයුතු සඳහා පමණක් වන අතර, ඒවායේ අදාල ආයතනවල සංචිත වාහන ලෙස භාවිතා කළයුතු ය. එම වාහනවල මිල සීමාවන් ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් පවත්නා වෙළඳ පොල මිල ගණන් පදනම්ව තීරණය කරනු ඇත.

| නිලධාරී කාණ්ඩය | නිෂ්පාදන බදු සහ රේගු බදු රහිත වාහනයක උපරිම වෙළඳ පොල මිල රු.මිලියන |
|---|---|
| අමාත්‍යාංශ ලේකම්වරු හෝ සමාන ධූරාවලි මට්ටමේ නිලධාරීන් | 5.00 |
| අතිරේක ලේකම්වරු/අධ්‍යක්ෂ ජනරාල්වරු/දිස්ත්‍රික් ලේකම්වරු/මණ්ඩල හා සමාගම් සභාපතිවරු හෝ සමාන මට්ටමේ නිලධාරීන් | 4.00 |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරු/අධ්‍යක්ෂවරු හෝ සමාන මට්ටමේ නිලධාරීන් | 3.00 |
| අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ සම්බන්ධීකරණ ලේකම්වරු | 2.50 |

## 7. ගෙවීම් පරිපාටිය සහ හිමිකම

මෙම චක්‍රලේඛයේ 4 වන ජේදය යටතේ අදාල කල්බදු සමාගමෙන් වාහනය අත්පත් කරගත් වහාම ඒ බව ආයතන ප්‍රධානීන් තම රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා මගින් ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත දැන්විය යුතු ය. එලෙස ලබාගත් බව අදාල රාජ්‍ය ආයතන ප්‍රධානීන් දැන්වීමෙන් පසු එම වාහනයේ වටිනාකම සමාන මාසික වාරික 60 කින් ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් වාහන මිලදී ගත් රාජ්‍ය ආයතන වෙනුවෙන් අදාල කල්බදු සමාගම වෙත ගෙවනු ලබයි. පළාත් සභාවන් පමණක් කෙලින්ම කල්බදු වාරිකය අදාල කල්බදු සමාගම වෙත ගෙවිය යුතු ය.

මෙම ක්‍රමය යටතේ ලබාගත් වාහනවල හිමිකම වාහනය ලබාගත් ආදල රාජ්‍ය ආයතනය වෙත එදින සිටම පැවරෙන අතර, එම වාහන ලියාපදිංචි කිරීම, රක්ෂණය කිරීම සහ නඩත්තුව අදාල රාජ්‍ය ආයතනය විසින් කළ යුතු ය.

## 8. වාහන අපහරණය සහ කුලී ගිවිසුම් අවසන් කිරීම

වාහන අපහරණය කිරීමේ පදනම මත නව වාහන මිල දී ගැනීමට අනුමැතිය ලැබී ඇති විට අපහරණය කළයුතු වාහනය නව වාහනය ලියාපදිංචි කළ දින සිට මාස 03 ක් ඇතුලත අපහරණය කළ යුතු ය. එම වාහන විකුණුම්වලින් ලැබෙන ආදායම දින 14 ක් ඇතුලත රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කළයුතු ය. පළාත් සභාවන් එම අදායම් පළාත් සභා අරමුදලට බැර කළ යුතු ය. කුලී වාහන ඉවත් කිරීමේ පදනම මත නව වාහන මිල දී ගත් විට, නව වාහන මිල දී ගත් වහාම එම කුලී ගිවිසුම අවසන් කළ යුතු ය.

## 9. පූර්ව චක්‍රලේඛ අවලංගු කිරීම

රාජ්‍ය ආයතන සඳහා ශ්‍රී ලංකා රේගුව විසින් වෙන්දේසි කරනු ලබන වාහන මිලදී ගැනීම සඳහා වන භාණ්ඩාගාර ලේකම්ගේ 2000.06.04 දින දරන ලිපිය සහ කුලී පදනම මත වාහන ලබාගැනීම පිළිබඳ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ අංක එම්එෆ්/ටීආර්/1/2003 හා 2003.03.28 දින දරන ලිපියේ අංක 02 ජේදය සහ අංක 353/(5) හා 2004.08.31 දින දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ අංක 02 ජේදය සහ/හෝ මේ හා අදාල වන වෙනත් අනුරූප චක්‍රලේඛ මෙයින් අවලංගු කෙරේ.

## 10. පැහැදිලි කිරීම

මෙම චක්‍රලේඛයේ සඳහන් කරුණු පිළිබඳව යම් පැහැදිලි කරගැනීමක් අවශ්‍ය වේ නම්, ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්, දූරකථන අංක 2484665 හෝ අයවැය අධ්‍යක්ෂ, දූරකථන අංක 2484669 ඇමතීමෙන් ලබාගත හැක.

පී.බී. ජයසුන්දර
භාණ්ඩාගාරයේ ලේකම්

පිටපත් : 1. ජනාධිපති ලේකම්
2. අමාත්‍ය මණ්ඩල ලේකම්
3. විගණකාධිපති

ඇමුණුම 01

*කල්බදු ක්‍රමය යටතේ වාහන මිලදී ගැනීම*

1. අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/ආයතනයේ නම :

2. වාහන ඉල්ලීමේ පදනම : පැරණි වාහනය අපහරණය කිරීම /කුලී වාහනය ඉවත් කිරීම/පවතින වාහන සංඛ්‍යාව වැඩි කිරීම

    2.1. පැරණි වාහනය අපහරණයට නම් එම පැරණි වාහනයේ විස්තර:

| වාහන වර්ගය (කාර්,වෑන්, ඩබල් කැබ් ආදිය) | වාහන අංකය | නිෂ්පාදිත වර්ෂය | ඉන්ධන වර්ගය (පෙට්‍රල්/ඩීසල්) | අනුයුක්ත/සංචිත ද යන්න | අපහරණය කිරීමට හේතුව |
|---|---|---|---|---|---|
| | | | | | |

    2.2 පවතින වාහන සංඛ්‍යාව වැඩිකිරීමට නම් එයට හේතුව : ……………………………..

3. වාහනය මිලදී ගැනීමට ඉල්ලන ආයතනයේ දැනට පවතින වාහන සංඛ්‍යාව පිළිබඳ විස්තර

| වාහන වර්ගය (කාර්,වෑන්, ඩබල් කැබ් ආදිය) | වාහන අංකය | නිෂ්පාදිත වර්ෂය | ඉන්ධන වර්ගය (පෙට්‍රල්/ඩීසල්) | අනුයුක්ත/සංචිත ද යන්න | කුලී / ආයතනයට අයත් වාහන ද යන්න |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |

4. අතිරේක විස්තර ලබාගැනීමට අවශ්‍ය වුවහොත් ඇමතිය යුතු නිලධාරීගේ නම සහ දුරකථන අංක :

…………………………………………………………………………………………………………………

නිර්දේශ කරමි/නිර්දේශ නොකරමි.

…………………………………… ……………………………………
ආයතන ප්‍රධානී අමාත්‍යාංශයේ ලේකම්

දිනය : දිනය: